# ලාංකීය සංස්කෘතිය තුළ අප්‍රිකානු සම්භවයක් සහිත කාපිරි ජනතාවගේ අනන්‍යතාවය

ආර්.ඒ.එම්.රණතුංග[51]

ශ්‍රී ලංකාව සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, යන ප්‍රධාන ජාතීන් හතරකට නිවහන සපයන්නා සේම ආදිවාසි වැදි ජනතාව, අහිකුන්ඨික ජනතාව, මැලේ ජනතාව, කාපිරි ජනතාව, වැනි අනෙකුත් කුඩා කණ්ඩායම් රැසකගේ ද වාස භූමිය වෙයි. මෙම කුඩා කණ්ඩායම් වලට ද ඔහුන්ටම ආවේණික සංස්කෘතික දායාදයන් පවතී. ආගම, භාෂාව, කලාව, අභිචාර වැනි සංස්කෘතිකාංග මෙන් ම මානව විද්‍යාත්මක අනන්‍යතාවයන් දරනු ලබයි. ඒ අතරින් කාපිරි ජනයා ඉතා සුවිශේෂී වේ. මානව විද්‍යාත්මක ව මොවුන් නිග්‍රොයිඩ් වර්ගයට අයත් වේ. එනම් රැලිගැසුනු හිසකෙස් සහ තද කළු සමක් දරන්නා වූත් ඉදිරියට නෙරා අති ඇස් හා පැතලි පුළුල් නාසය සහිත සණ තොල් ඇති හැඩිදැඩි ජාතියකි. කාපිරි ජනතාව ලංකාව තුළ කාබේරි කාබෙරි යනුවෙන් හඳුන්වන අතර Encyclopadia Britannic (1989) අනුව kafir යන්නෙන් අර්ථ නිරූපනය කරන්නේ අරාබි ඇදහීමක් නැති මිත්‍යාදෘෂ්ටික ගණයට අයත් දකුණු අප්‍රිකානු බන්ටු භාෂා කතාකරන මිනිසුන් වර්ගයක් ලෙස ය. කාපිරි ජනයා ලංකාව තුළ පැලපැදියම් වන්නේ බටහිර ජාතීන් ලංකාවට පැමිණීමත් සමග ය. බ්‍රෝහියර් ගේ 1984 වාර්තා වලට අනුව පෘතුගීසින් විසින් අප්‍රිකාවේ නැගෙනහිර වෙරළේ මොසැම්බික් හා උගන්ඩාව යන රටවලින් හා මැඩගස්කරය යන රටවලින් කාපිරි ජනතාව මෙරටට ගෙනැවිත් ඇත. මූලිකව ම පෘතුග්‍රීසීන් ගේ නිවාස වල වහල් සේවකයන් ලෙස මෙම අප්‍රිකානුවන් රැගෙන විත් ඇති අතර පසුකාලීන ව කච්චේරි හා රෝහල් වල සුළු සේවකයන් ලෙසත් හමුදා සෙබළුන් ලෙසත් මෙවුන් ගේ සේවය ලබාගෙන ඇත. පසුකාලීන ව ලන්දේසීන් යටතේත් ඉංග්‍රීසි පාලන සමයේත් කාපිරි ජනයාගේ සේවය ලබාගෙන ඇත. බ්‍රෝහියර් ගේ වාර්තා වලට අනුව 1807 දී ඉංග්‍රීසි හමුදාවේ 700 ක කාපිරි සේනාංකයක් සිටි බව සඳහන් වේ. 1945 දී ඉංග්‍රීසීන් මෙරට වහල් සේවය අහෝසි කිරීමත් සමගම බොහෝ කාපිරි ජනයා තම මව් රටවල් කරා ගිය ද සුළු පිරිසක් ඉංග්‍රීසි බලකොටු අවට පදිංචි වූහ. පුත්තලම දිස්ත්‍රික්කයේ සිරම්බිඅඩිය ග්‍රාමයේ පදිංචි ව සිටින්නේ එලෙස ඉතිරි වූ පිරිසකි. මෙම ජනතාව ඔහුන්ට ම ආවේණික වූ සුවිශේෂී සංස්කෘතියක් දරන්නේද යන්න සාකච්ඡා කිරීමේ දී භාෂාව ඉතා වැදගත් වේ. ලංකාව තුළ ඉතා අඩු ප්‍රතිශතයක් සිටීමත් සිංහලයන් සමඟ මිශ්‍ර වීමත් නිසා වර්තමාණයේ ඔවුන්ට ආවේණික ඉන්දු පෘතුග්‍රීසි බස ඔවුන් අතරින් වියැකී යමින් පවතී. එහෙත් සිංහල භාෂාව භාවිතයේ දි වුව ද තවමත් පෘතුග්‍රීසි වචන භාවිත කරයි. විශේෂයෙන් ම ඔහුන් ගේ බයිලා කපිරිඤ්ඤා සංගීතයේ දී එය මනාව හඳුනා ගත හැකි වේ. බහුතරයක් රෝමාණු කතෝලික ආගමිකයන් වුවද සිංහල ගැමි සංස්කෘතියත් පාරම්පරික අප්‍රිකානු සංස්කෘතියත් මුහු වූ විවිධ අභිචාර ක්‍රමයන් ද ලංකාවේ කාපිරි ජනයා සතු ව පවතී. ස්වභාවයෙන් ම විනෝදකාමී ජාතියක් වන කාපිරි ජනයා මෙවන් සුවිශේෂී සංස්කෘතියක් දරමින් පුත්තලම සිරම්බිඅඩිය ග්‍රාමයේ අදටත් වාසය කරයි. ලංකාවේ කාපිරි ජනතාව පිළිබඳ මූලාශ්‍ර ගත හා සහභාගීත්ව අධ්‍යනයක් තුළින් ඔවුන් සතුව පවත්නා වූ සංස්කෘතිය කෙබඳුද ? යන්න අනාවරණයකරගත හැකිය. ඒ අනුව ලංකාවේ ප්‍රධාන සංස්කෘතිය තුළ සීමිත ජනකොටසක් ලෙස කාපිරි ජනතාව කෙබඳු අනන්‍යතාවක් දරන්නේ ද යන්න නිගමනය කළහැකිය.

ප්‍රමුඛ පදඃ කාපිරි ජනතාව, සංස්කෘතිය, ආවේණික

[51]පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.